# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2371/48 - 2024 පෙබරවාරි මස 16 වැනි සිකුරාදා - 2024.02.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ හා
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 පෙබරවාරි මස 14 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/35 දරන රජයේ *අති විශෙෂ ගැසට්* නිවේදනයෙහි පළ කරන ලද 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග, සංශෝධිත පරිදි, (නියෝග), මෙමගින් පහත පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

i. නියෝගවල උපලේඛනයෙහි I වන කොටසේ "අ" ශීර්ෂය යටතේ I වන ජේදයේ (9) වන අනුජේදය ඒ යටතේ සිදුකරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙමගින් අවලංගු කරනු ලැබේ.

ii. නියෝගවල උපලේඛනයෙහි I වන කොටසේ "අ" ශීර්ෂය යටතේ 4 වන ජේදයේ (1) වන අනුජේදයේ (ඉ) අයිතමය මෙමගින් අවලංගු කරනු ලබන අතර පහත අයිතමය ඒ වෙනුවෙන් ආදේශ කරනු ලැබේ.

"(ඉ) ශ්‍රී ලංකාවේ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලෙස අර්ථ නිරූපණය කර ඇති සමාගම් සඳහා 2021 අංක 2 දරන විදේශ විනිමය නියෝග (සංශෝධිත පරිදි) යටතේ, වසර තුනකට අඩු කාලයක් සඳහා දැනටමත් ප්‍රදානය කර ඇති ණය සඳහා ආපසු ගෙවීම් සිදුකිරීමේදී, එම ණය ලබාගත් ණයගැනුම්කරුවාට එම ණය ආපසු ගෙවීම සඳහා ප්‍රමාණවත් විදේශ විනිමය ශේෂයන්/මුදල් ප්‍රවාහයන් නොමැති අවස්ථාවක දී, ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීම මගින් ආපසු ගෙවීම සඳහා අවසර ලබාදෙනු ලැබේ".

EOG 02 - 0132

1A - PG 6648 — 404 (2024/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*